සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018) S 1

## (01) ථෙරවාදී බුද්ධධර්මයේ මූලික ඉගැන්වීම

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

විභාග අංකය :..............................

### I කොටස

1. (i) බුදුසමයට අනුව සියලු ම ධර්ම බෙදෙන කොටස් දෙක නම් කරන්න.

(අ) ..................................................

(ආ) ..................................................

(ලකුණු 02 යි)

(ii) ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සඳහන් බැහැර කළ යුතු අන්ත දෙක දක්වන්න.

(අ) ..................................................

(ආ) ..................................................

(ලකුණු 02 යි)

(iii) පටිච්චසමුප්පාද ධර්මයේ එන නය ක්‍රම දෙක නම් කරන්න.

(අ) ..................................................

(ආ) ..................................................

(ලකුණු 02 යි)

(iv) ස්කන්ධ පංචකය බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න.

(අ) ..................................................

(ආ) ..................................................

(ලකුණු 02 යි)

(v) පරිනිර්වාණ ධාතු දෙක නම් කරන්න.

(අ) ..................................................

(ආ) ..................................................

(ලකුණු 02 යි)

[දෙවැනි පිටුව බලන්න.

(vi) නොවැදෑරුම් වේදනා දක්වන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

*(ලකුණු 03 යි)*

(vii) ත්‍රිලක්ෂණය නම් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

*(ලකුණු 03 යි)*

(viii) තුන්තරා බෝධිය නම් කරන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

*(ලකුණු 03 යි)*

(ix) අප්පමඤ්ඤා සතර දක්වන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

*(ලකුණු 04 යි)*

(x) පහත සඳහන් ගාථා පාදය ඇතුළත් ගාථාව සම්පූර්ණ කර ලියන්න.

න කහාපණවස්සේන

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

එම ගාථාවේ තේරුම දක්වන්න.

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

*(ලකුණු 05 යි)*

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

33793

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)** **S 1**

**(01) ථෙරවාදී බුද්ධධර්මයේ මූලික ඉගැන්වීම්**

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### II කොටස

2. (i) චතුරාර්ය සත්‍යය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය එම සත්‍යවලට අදාළ වන පරිද්දෙන් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) දුක ඇතිවීමට හේතු වන ආර්ය සත්‍ය නම් කර, එහි ප්‍රභේද ද දක්වා, ඒවා හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "නිර්වාණයත්, නිර්වාණගාමී ප්‍රතිපදාවත් අයත් වන්නේ චතුරාර්ය සත්‍යයට ම ය." මෙම ප්‍රකාශය ආර්ය සත්‍ය දේශනාව මගින් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) ආත්මවාදී ඉගැන්වීම්වලට අනුව පුද්ගලයා මරණයෙන් පසු උපදින ස්ථාන දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) "ආත්මවාදී සංඥාව බැහැර කරන බුදුසමය දෘෂ්ටි කෝණ තුනකින් සත්ත්වයා පිළිබඳ යථාර්ථය ඉදිරිපත් කරයි." එම දෘෂ්ටි කෝණ තුන නම් කර, කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) "භෞතික ලෝකයේ ජීව-අජීව සියල්ල ම සෑදී ඇත්තේ භූත රූප සතර මුල් කරගෙන ය." එම භූත රූප දක්වා, ඒවායේ ස්වභාවය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

4. (i) බුදුරජාණන් වහන්සේ විසින් භාරතයේ පැවැති හේතුඵලවාදී ඉගැන්වීම් මූලික කොටස් හතරකට බෙදා, ඒවා ප්‍රතික්ෂේප කරන ලදි. ඒ කොටස් හතර නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) එකී වාදවලින් වාද දෙකක ස්වභාවය හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) පටිච්චසමුප්පාද ධර්මය දේශනා කිරීමේ මූලික අරමුණු දක්වා, මහාවග්ගපාළියේ සඳහන් වන පරිදි ද්වාදසාංග පටිච්චසමුප්පාදය ඉදිරිපත් කරන්න. *(ලකුණු 08 යි)*

5. (i) බුද්ධකාලීන ෂඩ් ශාස්තෘවරුන් අතර කර්මවාදය හා පුබ්බේකත හේතුවාදය ප්‍රතික්ෂේප කළ ශාස්තෘවරුන් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) "චේතනාවට මුල්තැන දී කර්මය විවරණය කිරීම බුදුසමයේ මූලික ලක්ෂණයකි." පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) විපාක දෙන පිළිවෙළ අනුව කර්මයේ ප්‍රභේද දක්වා, ඒවායින් දෙකක් හඳුන්වන්න. *(ලකුණු 08 යි)*

6. (i) කුසලමූල හා අකුසලමූල නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) දස කුසල් දක්වා, ඒවා ද්වාරත්‍රයට බෙදා දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රයේ දැක්වෙන කුසල-අකුසල විනිශ්චය කිරීමේ නිර්ණායක දක්වා, ඒවා නොසලකා හැරීම පුද්ගල හා සමාජ පරිහානියට හේතු වන බව පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

7. (i) 'බෝධි' නමින් හැඳින්වෙන ලෝකෝත්තර මාර්ග ඥාන නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ඉන්ද්‍රිය ධර්ම නම් කර, ඒවාට එම නම ව්‍යවහාර කිරීමේ හේතුව සැකෙවින් දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) සතර සතිපට්ඨාන ධර්ම වැඩීමේ අනුසස් දක්වා, චිත්ත දමනය සඳහා චිත්තානුපස්සනාව පිහිට කර ගත හැකි ආකාරය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

8. (i) බුදුසමයේ දැක්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක දක්වා, පඤ්ච අභිඥා හා අෂ්ට සමාපත්ති උපදවා ගත හැකි භාවනාව හඳුන්වන්න. *(ලකුණු 04 යි)*

(ii) භාවනාව සඳහා අරමුණු කර ගත යුතු දසකසිණ නම් කර, ඉන් දෙකක් සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "මානසික දුර්වලතා බැහැර කොට, මානසික ශක්තීන් සංවර්ධනය කර ගැනීම නීවරණ ධර්ම බැහැර කිරීම මගින් සිදු කර ගත හැකි ය." පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)** **S 2**

**(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය**

පැ තුනයි

**I** කොටසේ ප්‍රශ්නය ද, **II** වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. **I** කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, **II** කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

විභාග අංකය :.............................

## I කොටස

**1.** (i) සිට (vii) තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) (අ) බුද්ධෝත්පත්ති සමයෙහි සිටි බොහොමයක් ශ්‍රමණ පිරිස් (ආත්මාර්ථ සාධනය/පරාර්ථ සාධනය) කෙරෙහි වඩාත් උනන්දු වූහ.

(ආ) පස්වග තවුසන් ඇතුළු බොහෝ පැවිද්දන් දැඩිව විශ්වාස කළේ (අත්තකිලමථානු යෝගය/මධ්‍යම ප්‍රතිපදාව) මගින් විමුක්තිය ලැබිය හැකි බවයි.

*(ලකුණු 02 යි)*

(ii) (අ) භික්ෂූන් සිවුපසය පරිභෝග කළ යුතු වන්නේ (ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන්/දායකයන්ට පින් දීමෙන්) පසුව බව බුද්ධ දේශනාවේ සඳහන් වේ.

(ආ) දැහැමිව උපයාගත් ධනයෙන් ලෞකික ජීවිතය ධාර්මිකව ගත කරන (භික්ෂුව/උපාසකයා) මරණින් පසුව සුගතිගාමී වන බව ධර්මයෙහි දැක්වේ.

*(ලකුණු 02 යි)*

(iii) (අ) සිගාලෝවාද සූත්‍රයෙහි සදිසා නමස්කාරයට අනුව මහණ බමුණන් (උඩ දිසාව/නැගෙනහිර දිසාව) නියෝජනය කරන බව සඳහන් වේ.

(ආ) තමාට සංග්‍රහ කරන කුලපුත්‍රයාට මහණ බමුණන් (පැවිද්ද ලබා දීමෙන්/නො ඇසූ ධර්මය කියා දීමෙන්) අනුකම්පා කළ යුතු බව සිගාලෝවාද සූත්‍රයෙහි උගන්වා ඇත.

*(ලකුණු 02 යි)*

(iv) (අ) ගුණ දහමෙන් තමන්ට වැඩි හෝ තමන්ට සමාන මිතුරෙකු ඇසුරට නොවේ නම් (ඥානවන්තයකු සමග/හුදෙකලාව) විසීම යෝග්‍ය බව ධම්මපදයෙහි දැක්වේ.

(ආ) ක්ෂත්‍රිය වංශයෙහි උපතත්, බුදුරජාණන් වහන්සේගේ ඥාතිත්වයත් (චුල්ලතිස්ස/නන්ද) තෙරුන්ගේ උඩඟුකමට හේතු වූ බව ධම්මපද නිදාන කථාවක සඳහන් වේ.

*(ලකුණු 02 යි)*

(v) (අ) 'තාදි ගුණය' යනු (කෙලෙසුන් තැවීමයි./අටලෝ දහමෙහි කම්පා නොවීමයි.)

(ආ) දානය දසමහා කුසල්වලට (අයත් වන/අයත් නොවන) පින්කමකි.

*(ලකුණු 02 යි)*

(vi) (අ) ප්‍රාණඝාතය ආදී පස් පවෙන් වැළකී ජීවත්වන තැනැත්තා (ගුණවතෙකි./සිල්වතෙකි.)

(ආ) 'අසෙවනා ච බාලානං' යන පාලි පාඨයෙන් අදහස් වන්නේ (බාලයන් ඇසුරු නොකළ යුතු/පණ්ඩිතයන් ඇසුරු කළ යුතු) බව ය.

*(ලකුණු 02 යි)*

[2 වැනි පිටුව බලන්න.

(vii) (අ) බුදුරජාණන් වහන්සේ ජේතවනයෙහි වසන කල්හි මව පෝෂණය කරන භික්ෂුවක අරබයා (සාලිකේදාර/මණිකණ්ඨ) ජාතකය දේශනා කළ සේක.

(ආ) සැබෑ නායකයකු තුළ තිබිය යුතු ගුණාංග මනාව ප්‍රකට වන්නේ (තිත්තිර/මහාකපි) ජාතක කථාවෙනි.

(ලකුණු 02 යි)

(viii) සිංහලට නගන්න.

(අ) අත්තනො'ව අවෙක්ඛෙය්‍ය - කතානි අකතානි ච

.......................................................................................................

.......................................................................................................

(ආ) උදකංහි නයන්ති නෙත්තිකා - උසුකාරා නමයන්ති තෙජනං

.......................................................................................................

.......................................................................................................

(ලකුණු 04 යි)

(ix) පහත සඳහන් අදහස් ඇති ධම්මපද ගාථා ලියන්න.

(අ) සොරෙක් සොරෙකුට යම් නපුරක් කෙරේ ද, එසේ ම වෛර ඇති කෙනෙක් වෛරී පුද්ගලයකුට යම් නපුරක් කෙරේ ද, ඊටත් වඩා නපුරක් වරදවා තබන ලද සිත ඔහුට කරන්නේ ය.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(ආ) ඈඩි ලෙස ඝන වූ පර්වතය සුළඟින් නොසැලෙන්නේ යම් සේ ද, එමෙන් නුවණැත්තෝ නින්දා ප්‍රශංසාවන්හි කම්පා නොවෙති.

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

(ලකුණු 04 යි)

(x) 'අ' කොටසේ යෙදුමට සම්බන්ධතාවක් දක්වන ඒවා 'ආ' කොටසෙන් තෝරා, **තිත් ඉර මත ලියන්න.**

| 'අ' | | 'ආ' |
|---|---|---|
| අධික තෘෂ්ණාව | .................................... | අයට වඩා වැය |
| උදුම්බරඛාදික | .................................... | අධිකරණ සමථ |
| ගැටුම් නිරාකරණය | .................................... | කොසිය සිටු |
| පහත් චරිත ලක්ෂණ | .................................... | ධම්මික සූත්‍රය |
| පොහොයවත | .................................... | ප්‍රාතිමෝක්ෂය |
| භික්ෂු විනය | .................................... | වසල සූත්‍රය |

(ලකුණු 06 යි)

❊ ❊

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)** **S 2**

**(02) බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය**

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

2. (i) ෂට් ශාස්තෘවරුන් අතුරින් ආත්මවාදය හෝ නාස්තික දෘෂ්ටිය නියෝජනය කළ ශාස්තෘවරුන් හතරදෙනෙකු නම් කරන්න. *(ලකුණු 04 යි)*

 (ii) යසකුල පුත්‍රයාගේ පැවිද්ද පිළිබඳව කෙටියෙන් ලියන්න. *(ලකුණු 06 යි)*

 (iii) විනයෙහි දැක්වෙන පැවිදි නොකළ යුතු පුද්ගලයන් අතුරින් සිව් දෙනෙකු දක්වා, ඔවුන් පැවිද්දට සුදුසු නොවන්නේ කවර හේතු නිසා දැයි පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

3. (i) සිගාලෝවාද සූත්‍රයට අනුව කුලපුත්‍රයකු විසින් මහණ බමුණන්ට උපස්ථාන කළ යුතු ආකාර හතරක් ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

 (ii) කුලපුත්‍රයකු විසින් මහණ බමුණන් උදෙසා තම යුතුකම් ඉටු කළ විට ශාසනයේ පැවැත්ම තහවුරු වන ආකාරය දක්වන්න. *(ලකුණු 06 යි)*

 (iii) දැහැමි සමාජයක් ගොඩනැගීම සඳහා ගිහි පැවිදි සම්බන්ධය ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

4. (i) චන්ද්‍ර මාස ක්‍රමය අනුව ලැබෙන උපොසථ දින හතර නම් කරන්න. *(ලකුණු 04 යි)*

 (ii) උපොසථය සඳහා සංඝයා රැස්වීමට පෙර සිදු කළ යුතු 'පුබ්බකරණය' පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

 (iii) පොහොය කර්මය තුළින් භික්ෂූන් අතර සමගිය හා පාරිශුද්ධිය ඇති වන අයුරු පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

5. (i) සිංහලට නගන්න.
 (අ) උපාසකො චීවරං අදාය බුද්ධං පූජෙති.
 (ආ) තුම්හෙ බුද්ධස්ස ධම්මං සුනාථ.
 (ඉ) දුට්ඨගාමිණී මහාරාජා ලංකාදීපං පාලයි.
 (ඊ) පිතා පුත්තෙන සද්ධිං නගරං ගච්ඡති. *(ලකුණු 08 යි)*

 (ii) මෙම වාක්‍ය පාලියට නගන්න.
 (අ) දායකයා භික්ෂු සංඝයාට දන් දෙයි.
 (ආ) භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ පා වැන්දාහ.
 (ඉ) සුදුසු කාලයෙහි වැසි වසීවා!
 (ඊ) අපි මව්පියන් සමග බුදුන් වඳින්නෙමු.
 (උ) භික්ෂුව ගමට ගොස් දහම් දෙසයි. *(ලකුණු 10 යි)*

6. (i) මෙම පාඨය සිංහලට නගන්න.
 අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ බොධිසත්තො හිමවන්තප්පදෙසෙ හත්ථියොනියං නිබ්බත්තිත්වා සබ්බසෙතො අහොසි, අභිරූපො. අසීති හත්ථිසහස්ස පරිවාරො. මාතා පන'ස්ස අන්ධා. සො මධුරමධුරානි ඵලාඵලානි හත්ථීනං දත්වා මාතුසන්තිකං පෙසෙති. *(ලකුණු 08 යි)*

 (ii) මව්පිය උපස්ථානය පිළිබඳව මාතුපෝසක ජාතක කථාවෙන් ලබා දෙන ආදර්ශය අගය කරන්න. *(ලකුණු 10 යි)*

7. (i) මෙම පාඨය සිංහලට නගන්න.
 අථෙකදිවසං මණිකණ්ඨො නාම නාගරාජා භවනා නික්ඛමිත්වා ගඞ්ගාතීරෙ මාණවක වෙසෙන විචරන්තො කණිට්ඨස්ස අස්සමං ගන්ත්වා එකමන්තං නිසීදි, තෙ අඤ්ඤමඤ්ඤං සම්මොදනකථං කත්වා විස්සාසිකා අහෙසුං. *(ලකුණු 08 යි)*

 (ii) මණිකණ්ඨ ජාතකයෙහි සඳහන් වන නාරජුගේ හා තවුසාගේ කථා ප්‍රවෘත්තිය ඇසුරෙන් සිතේ ස්වභාවය පහදා දෙන්න. *(ලකුණු 10 යි)*

* * *

34286

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)** **S 3**

**(03) අභිධර්මය**

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද II කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

විභාග අංකය :..............................

## I කොටස

1. (i) ත්‍රිපිටකය තුළ නිප්පරියාය දේසනා හා සප්පරියාය දේසනා අන්තර්ගත වන පිටක දෙක පිළිවෙළින් නම් කරන්න.

(අ) ..............................

(ආ) ..............................

*(ලකුණු 02 යි)*

(ii) ථෙරීය විභජ්ජවාදී අභිධර්ම සම්ප්‍රදායයට අයත් සප්තප්‍රකරණයෙන් හතරක් නම් කරන්න.

(අ) ..............................

(ආ) ..............................

(ඉ) ..............................

(ඊ) ..............................

*(ලකුණු 02 යි)*

(iii) ද්වේෂමූලික අකුසල් සිත්වල 'පටිඝය' ඇතිවීමට හේතු වන කරුණු තුනක් දක්වන්න.

(අ) ..............................

(ආ) ..............................

(ඉ) ..............................

*(ලකුණු 03 යි)*

(iv) ශීල ශික්ෂාවට අයත් මාර්ගාංග නම් කරන්න.

..............................

..............................

..............................

*(ලකුණු 03 යි)*

(v) සෝවාන් මාර්ග ඥානයෙන් ක්‍ෂය වන සංයෝජන නම් කරන්න.

..............................

..............................

..............................

*(ලකුණු 03 යි)*

[දෙවැනි පිටුව බලන්න.

(vi) අනාගාමී ඵලය උපදවා ගත් උතුමන්ට අදාළ විශේෂ ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න.

(අ) ..............................................................................................

(ආ) ..............................................................................................

(ඉ) ..............................................................................................

*(ලකුණු 03 යි)*

(vii) ඉස්සා - මච්ඡරිය යන අකුසල චෛතසික දෙකේ වෙනස පෙන්වා දෙන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

*(ලකුණු 03 යි)*

(viii) බ්‍රහ්ම විහාර භාවනාව හඳුන්වන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

*(ලකුණු 03 යි)*

(ix) යෝනිසෝමනසිකාරය හඳුන්වා, එයින් ලැබෙන ප්‍රයෝජන දෙකක් දක්වන්න.

(අ) හැඳින්වීම : ..............................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

(ආ) ප්‍රයෝජන : ..............................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

*(ලකුණු 03 යි)*

(x) 'උපාදාන පච්චයා භවො' යන්න පැහැදිලි කරන්න.

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

*(ලකුණු 03 යි)*

* *

[තුන්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)** **S 3**

**(03) අභිධර්මය**

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

**II කොටස**

**2.** (i) (අ) අභිධර්මයට අදාළ නිදාන දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) 'සුත්තන්ත පරියාය' යන්න පහදන්න. *(ලකුණු 03 යි)*

(ii) ථෙරීය විභජ්ජවාදී අභිධර්ම සම්ප්‍රදාය පිළිබඳව හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ධම්මසංගණිප්පකරණය පිළිබඳව එහි ඇතුළත් මූලික කරුණු පදනම් කර ගනිමින් විස්තරයක් කරන්න. *(ලකුණු 07 යි)*

**3.** (i) (අ) "සබ්බෙ ධම්මා අනත්තාති" යන ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. *(ලකුණු 03 යි)*

(ii) එම ගාථාවේ දැක්වෙන 'ධම්මා' යන පදය හා සතර පරමාර්ථ ධර්ම අතර ඇති සම්බන්ධය පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) සම්මුති සත්‍යය හා පරමාර්ථ සත්‍යය අතර වෙනස උදාහරණ සහිතව පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

**4.** (i) (අ) අකුසල මූල නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) අකුසල් සිත්වල දිට්ඨි සම්පයුත්ත බව ඇතිවීමට බලපාන සාධක තුනක් පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(ii) පළමුවැනි හා දෙවැනි ලෝභ මූල අකුසල් සිත් දෙක නම් කොට, එම සිත් දෙකෙහි වෙනස සනිදර්ශනව පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පුද්ගල සන්තානයේ පරිහානියට අකුසල මූල හේතු වන අයුරු පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

**5.** (i) (අ) අඤ්ඤසමාන චෛතසිකවල මූලික ප්‍රභේද දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) ඉන් එක් ප්‍රභේදයක් පිළිබඳව පැහැදිලි කරන්න. *(ලකුණු 03 යි)*

(ii) අප්පමඤ්ඤා චෛතසික නම් කර, එම චෛතසික පිළිබඳව හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) සද්ධා චෛතසිකය හඳුන්වා, එම චෛතසිකය පෙරටුවීමෙන් පුද්ගලයා බොහෝ කුසලයන්ට නැඹුරු වන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

**6.** (i) (අ) පංචස්කන්ධය පිළිවෙළින් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එම ස්කන්ධ චිත්ත, චෛතසික, රූප යන පරමාර්ථ ධර්මවලට බෙදා දක්වන්න. *(ලකුණු 03 යි)*

(ii) "චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි, චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා." යන පාඨයේ සරල අදහස දක්වා, පංචස්කන්ධයේ සිවුවැන්න පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) චතුර්විධ විපල්ලාස නම් කර, ඒවා පුද්ගලයාට යථාර්ථය දැකීමට බාධා කරන අයුරු සනිදර්ශනව පහදන්න. *(ලකුණු 07 යි)*

[හතරවැනි පිටුව බලන්න.

**7.** (i) (අ) භවාංග චිත්තයේ කාර්යය පැහැදිලි කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එක් චිත්තක්ෂණයක් තුළ ක්‍රියාත්මක වන අවස්ථා තුන නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) චිත්තවීථි සටහනක දැක්වෙන පංචද්වාරාවජ්ජන, සොතවිඤ්ඤාණ හා සම්පටිච්ඡන යන චිත්ත ක්ෂණයන්ගෙන් කෙරෙන කාර්ය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ශ්‍රෝතද්වාරික අතිමහන්තාරම්මණ චිත්තවීථි සටහන ඇඳ, අතිමහන්තාරම්මණ හා මහන්තාරම්මණ චිත්තවීථි අතර මූලික වෙනස පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

**8.** (i) (අ) කර්මයේ විපාක මූලික ප්‍රභේද දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) මනසින් කෙරෙන අකුසල කර්මපථ නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) කර්මයෙන් කෙරෙන කෘත්‍ය සතර පිළිවෙළින් නම් කර, එහි පළමුවැන්න හඳුන්වන්න. *(ලකුණු 06 යි)*

(iii) "මිනිසාට මුහුණ දීමට සිදුවන්නේ 'කම්ම නියාමයට' පමණක් නොවේ." සනිදර්ශනව තහවුරු කරන්න. *(ලකුණු 07 යි)*

**9.** (i) (අ) "යත්‍ථ සීලං තත්‍ථ පඤ්ඤා - යත්‍ථ පඤ්ඤා තත්‍ථ සීලං" යන පාඨයේ සරල අදහස ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) විරති සීලය හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(ii) සීලයෙන් කායික වාචසික සංවරය ඇති කෙරෙන ආකාරය පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) "ප්‍රඥාව වැඩිය හැකි එකම මාර්ගය වන්නේ සීලයෙන් ඉන්ද්‍රිය සංවර කර ගැනීම හා භාවනාවෙන් සමාධිය උපදවා ගැනීමයි." ප්‍රමාණවත් කරුණු සහිතව සනාථ කරන්න. *(ලකුණු 07 යි)*

* * *

33961

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)**

**S 4**

**(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය**

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාරදෙන්න.

විභාග අංකය :..............................

## I කොටස

1. (i) (අ) ථෙරවාද සම්ප්‍රදාය අනුව භාරතයේ පැවැත්වූ සංගායනා ගණන කීය ද?

..........................................................................................................

(ආ) මෙයින් දෙවන සංගායනාව පවත්වන ලද්දේ කවුරුන්ගේ මතවාද ඛණ්ඩනය කිරීම සඳහා ද?

..........................................................................................................

(ලකුණු 02 යි)

(ii) (අ) ප්‍රථම සංගීතියේ දී සාකච්ඡාවට භාජනය වූ ඉතා වැදගත් ගැටලුව කුමක් ද?

..........................................................................................................

(ආ) මේ නිසා විනය සංශෝධන අපේක්ෂා කළ පිරිස් නැඹුරු වී සිටියේ කවර අරමුණක් සඳහා ද?

..........................................................................................................

(ලකුණු 02 යි)

(iii) (අ) 'මහාසංගීති' නමින් නව සංගායනාවක් පැවැත්වූයේ කවර කරුණක් මුල් කොට ගෙන ද?

..........................................................................................................

(ආ) මේ කරුණ ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?

..........................................................................................................

(ලකුණු 03 යි)

(iv) (අ) සම්මිතීය නිකායයේ ඉතිහාසය ලියන ලද්දේ කවරෙකු විසින් ද?

..........................................................................................................

(ආ) මේ නිකායේ වැඩි අවධානයක් යොමු වූයේ කවර සංකල්පයක් සඳහා ද?

..........................................................................................................

(ලකුණු 03 යි)

[2 වැනි පිටුව බලන්න.

(v) (අ) ධර්මාශෝක රාජ්‍ය සමයට පෙර ථෙරවාද සම්ප්‍රදායයෙන් බෙදී ගිය නිකාය කුමක් ද?

..........................................................................................................

(ආ) මේ කාලය තුළ මහාසාංඝිකයන්ගෙන් බෙදී ගිය නිකාය දෙක කවරේ ද?

..........................................................................................................

..........................................................................................................

*(ලකුණු 03 යි)*

(vi) (අ) පංචස්කන්ධය හුදෙක් ගිනි අඟුරු ගොඩක් ලෙස උගන්වන ලද්දේ කවර නිකායයක් මගින් ද?

..........................................................................................................

(ආ) ලොව පවත්නා සියලු දේ හුදු නාමමාත්‍ර හා සංකල්ප පමණක් බව ඉගැන්වූවෝ කවරහු ද?

..........................................................................................................

*(ලකුණු 03 යි)*

(vii) (අ) 'මාඝාත' නීතිය පැනවූ භාරතීය රජතුමා කවරෙක් ද?

..........................................................................................................

(ආ) 'මාඝාත' යන්නෙහි අර්ථය කුමක් ද?

..........................................................................................................

*(ලකුණු 03 යි)*

(viii) (අ) අශෝක අධිරාජයාගේ අනුශාසනා භාරතීය ජනතාව අතර ප්‍රචාරය කිරීමට යෙදූ උපාය මාර්ගය කුමක් ද?

..........................................................................................................

(ආ) එම උපාය මාර්ගය අනුව ස්වකීය අනුශාසනා ප්‍රදර්ශනය කිරීමට රජතුමා යෙදූ ක්‍රමවිධි කවරේ ද?

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

*(ලකුණු 03 යි)*

(ix) (අ) භදන්ත අශ්වඝෝෂ හිමියන් ජීවත් වූයේ කවර රාජ්‍ය සමයක දී ද?

..........................................................................................................

(ආ) භදන්ත අශ්වඝෝෂ හිමියන් සැලකෙන්නේ කවර බෞද්ධ නිකායකට අයත් වූවකු ලෙස ද?

..........................................................................................................

*(ලකුණු 03 යි)*

(x) (අ) සමන්තපාසාදිකා විනය අටුවාව ලිවීමට ආරාධනා කළේ කවුරුන් විසින් ද?

..........................................................................................................

(ආ) මේ කෘතියේ කතුවරයාගේ නම කුමක් ද?

..........................................................................................................

*(ලකුණු 03 යි)*

**

[3 වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)** **S 4**

**(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය**

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

**2.** (i) බුදු දහමේ ඉගැන්වෙන ඇතැම් කරුණු අශෝක අධිරාජයා විසින් සිය පාලන ප්‍රතිපත්ති සඳහා උපයෝගී කරගත් අයුරු එතුමාගේ සෙල්ලිපි ඇසුරෙන් සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකාවට බුදුදහම ලැබුණේ මෙරට පාලකයන් හා භාරතයේ අශෝක අධිරාජයා අතර පැවති සංස්කෘතික සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙන් බව සනාථ කෙරෙන සාධක ඉදිරිපත් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ශ්‍රී ලංකාවේ බුදුදහම පිහිටුවීම හා ආශ්‍රිතව පවත්නා ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

**3.** (i) මහායාන බුදුසමයෙහි ඇතුළත් බෝධිසත්ත්ව සංකල්පය විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(ii) 'බෝධි චිත්තය' යනු කුමක් දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) මහායාන බුදුසමයෙහි දැක්වෙන අමිතාභ බුද්ධ වන්දනාව පිළිබඳ ව විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

**4.** (i) භාරතයේ නාලන්දා විශ්වවිද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) නාලන්දා විශ්වවිද්‍යාලයේ ප්‍රවේශ පරීක්ෂණයේ ස්වරූපය කෙබඳු වී දැයි විමර්ශනය කරන්න. *(ලකුණු 06 යි)*

(iii) නාලන්දා විශ්වවිද්‍යාලයේ ඉගැන්වූ විෂයධාරා පහ විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

**5.** (i) 'හෙළටුවා' යනු කවරේ දැයි හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(ii) බුද්ධදත්ත හිමියන් විසින් ලියන ලද අටුවා හා අනෙකුත් ග්‍රන්ථ පිළිබඳ සමාලෝචනයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) පෙළ පොත්වලට පසුව රචනා කළ වැදගත් පාලි ගද්‍ය ග්‍රන්ථ දෙකක් ගැන විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

**6.** (i) සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය පිළිබඳ හැඳින්වීමක් කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ජපානයේ පැතිර ගිය නිචිරෙන් නිකාය ගැන විස්තරයක් සපයන්න. *(ලකුණු 06 යි)*

(iii) සෙන් බුදුසමයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

**7.** (i) ලක්වැසියන් අතර පැතිර ගිය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය පොදුජන විශ්වාසවලට අනුකූලව ක්‍රමයෙන් හැඩගැසුණු ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) ශ්‍රී ලංකාවේ අනුරාධපුරයෙන් ආරම්භ වූ බුදුසමය රෝහණ ජනපදය තෙක් පැතිර යාමට බල පෑ හේතු සාධක විස්තර කරන්න. *(ලකුණු 06 යි)*

(iii) දුටුගැමුණු රජුගේ දේශපාලන කාර්යයේ සඵලතාව සඳහා අදාළ පසුබිම කාවන්තිස්ස රජතුමා විසින් සකස් කළ බවට දැක්විය හැකි හේතු සාධක කවරේ දැයි පිරික්සන්න. *(ලකුණු 06 යි)*

**8.** (i) බෞද්ධ ස්තූප නිර්මාණය ආරම්භයේ දී හා පරිණාමයේ දී දක්නට ලැබුණු විශේෂතා මොනවා දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(ii) වටදා ගෙය හඳුන්වා, ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වටදා ගෙවල් පිළිබඳ විස්තරයක් කරන්න. *(ලකුණු 06 යි)*

(iii) බෞද්ධ ස්තූප වර්ග නම් කොට, ඒවායින් හතරක ආකෘතික ලක්ෂණ හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

* * *

33487

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)

**S 5**

## (05) බෞද්ධ සමාජදර්ශනය

පැ තුනයි

I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

සැ.යු. I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම ලියා, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාරදෙන්න.

විභාග අංකය :..............................

---

### I කොටස

1. (i) සමාජවිද්‍යා විෂය හා සමාජදර්ශනය අතර පවත්නා වෙනස කුමක් ද? *(ලකුණු 01 යි)*

........................................................................................................................

........................................................................................................................

(ii) බුදුරජාණන් වහන්සේ දෙමව්පියන් හැඳින්වීමට භාවිත කළ ගෞරවනීය වචන (අධිවචන) තුනක් ලියා, ඒවායෙහි අදහස් පෙන්වා දෙන්න. *(ලකුණු 03 යි)*

(අ) ........................................................................................................

(ආ) ........................................................................................................

(ඉ) ........................................................................................................

(iii) "ඇසුරට සුදුසු යැයි තමන් විසින් තෝරා ගන්නා යහපත් (කල්‍යාණ) මිත්‍රයන්ට සංග්‍රහ කළ යුතු ආකාරය බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක." එම කරුණු අතුරින් තුනක් ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) ........................................................................................................

(ආ) ........................................................................................................

(ඉ) ........................................................................................................

(iv) "අග්ගඤ්ඤ සූත්‍ර විවරණයට අනුව සමාජයෙහි නුදුන් දේ ගැනීම් ආදී අසද්ධර්ම පහළ වූ බැවින්, හෙළා දැකිය යුත්තන් හෙළා දකින්නට, ගැරහිය යුත්තන් ගරහන්නට, පිටුවහල් කළ යුත්තන් පිටුවහල් කරන්නට සමත් අභිරූපී, දර්ශනීයතර, සිත් පහදවනසුලු මහේශාක්‍ය පෙනුමැති පුද්ගලයකු ඔවුහු තෝරා ගත්හ'යි පැවසේ." එම තැනැත්තා හැඳින්වීමට භාවිත කළ යෙදුම් තුනක් ඊට අදාළ අර්ථ සමඟ දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) ........................................................................................................

(ආ) ........................................................................................................

(ඉ) ........................................................................................................

(v) 'ප්‍රාණඝාත විරමණ ශික්ෂාව පරිපූර්ණ වීම සඳහා විරති හා සමාදාන යන දෙඅංශය ම සම්පූර්ණ විය යුතු වේ.' ඒ අනුව, 'පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති නිහිතදණ්ඩො, නිහිතසත්ථො, ලජ්ජී, දයාපන්නො, සබ්බපාණභූතහිතානුකම්පී විහරති' යන්නෙහි විරති පක්ෂයට හා සමාදාන පක්ෂයට අයත් අංග තුන බැගින් වෙන්කොට දක්වන්න. *(ලකුණු 03 යි)*

විරති :

(අ) ........................................................................................................

(ආ) ........................................................................................................

(ඉ) ........................................................................................................

[2 වැනි පිටුව බලන්න.

**සමාදාන :**

(අ) ..............................................................................................................

(ආ) ..............................................................................................................

(ඉ) ..............................................................................................................

(vi) සමාජ ශෝධකයකු ලෙස බුදුරජාණන් වහන්සේ චතුර්වර්ණ ඉගැන්වීම නිර්දය ලෙස ප්‍රතික්ෂේප කරමින් දේශනා කළ සූත්‍ර ධර්ම තුනක් නම් කර, ඒවාට අයත් ඉගැන්වීම් තුනක් ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) ..............................................................................................................

(ආ) ..............................................................................................................

(ඉ) ..............................................................................................................

(vii) "ජීවිත රැක දීම සඳහා කැපවීම තුළින් ලබන පරාජය ද ජයග්‍රහණයකි." මෙම ආකල්පය බෞද්ධ ඉතිහාසයේ නිරූපණය වූ අයුරු අගය කරමින් ජෝන් වෝල්ටර්ස් නම් ලේඛකයා විසින් 'නොසැලෙන මනස' නම් ග්‍රන්ථයේ දැක්වූ කරුණු තුනක් ඉදිරිපත් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) ..............................................................................................................

(ආ) ..............................................................................................................

(ඉ) ..............................................................................................................

(viii) බුද්ධකාලීන භාරතයේ සොළොස්මහා ජනපද අතුරින් රාජාණ්ඩු පාලනය පැවති ජනපද තුනක් නම් කර, ඒවායෙහි රාජ්‍ය පාලනයේ මූලික ලක්ෂණ එක බැගින් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(අ) ..............................................................................................................

(ආ) ..............................................................................................................

(ඉ) ..............................................................................................................

(ix) කූටදන්ත සූත්‍රය නිර්දේශ කරන, වෙළෙඳාම හැර වෙනත් දැහැමි ජීවන වෘත්තීන් තුනක් නම්කොට, පඤ්චවිධ වෙළෙඳාමෙන් වෙන්වීම මූලික මානව හිමිකම් උල්ලංඝණය නොවන්නක් බවට හේතු තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) ..............................................................................................................

(ආ) ..............................................................................................................

(ඉ) ..............................................................................................................

(x) "නූතන ආර්ථික චින්තනය නිෂ්පාදනය, පරිභෝජනය, බෙදාහැරීම වැනි කරුණු පිළිබඳව සාකච්ඡා කරන ආකාරයෙන් බුදුදහම ඒ ගැන දේශනා නොකළත්, ඊට සාපේක්ෂ ආර්ථික චින්තනයක් ඉදිරිපත් කරයි." බුදුසමය නිර්දේශ කරන ආර්ථික චින්තනයේ මූලික සංකල්ප තුනක් ඊට අදාළ නිදර්ශන තුනක් සමඟ දක්වන්න. *(ලකුණු 03 යි)*

(අ) ..............................................................................................................

(ආ) ..............................................................................................................

(ඉ) ..............................................................................................................

* *

33487

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2562 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2017 (2018)** **S 5**

**(05) බෞද්ධ සමාජදර්ශනය**

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

**II කොටස**

2. (i) සමාජ දර්ශන විෂය ක්ෂේත්‍රය සඳහා අනුග්‍රහය දක්වන විෂය හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

   (ii) දැඩි ශාස්ත්‍රීය බව රැක ගැනීම පිණිස වාස්තවිකව සිදු කරන විද්‍යාත්මක අධ්‍යයනවල දී මගහැරී යන සදාචාර නිර්ණායක හතරක් පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

   (iii) "බුදුසමය හුදු ආගමික සිද්ධාන්ත සමුදායකට වඩා සමාජ දර්ශනයකි." විෂය ක්ෂේත්‍ර හතරකට අයත් බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න. *(ලකුණු 07 යි)*

3. (i) බුදුසමයේ සමාජ දර්ශනය පිළිබඳ සංකල්පය ප්‍රකට කෙරෙන සූත්‍ර දේශනා හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

   (ii) සදිසා නමස්කාර සමාජ සංකල්පයෙහි සදිසා නම් කර, ඊට අදාළ පුද්ගල ප්‍රභේද කවරේ දැයි කෙටියෙන් හඳුන්වන්න. *(ලකුණු 07 යි)*

   (iii) නූතන පවුල් සංස්ථාවෙහි අඹු-සැමියන් අතර පැනනැගී ඇති ගෘහස්ථ අර්බුද අවම කර ගැනීමෙහිලා සිගාලෝවාද සූත්‍රයේ ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් කෙතෙක් දුරට අදාළ වේ දැයි විමසන්න. *(ලකුණු 07 යි)*

4. (i) සමාජ සංස්ථාවල ප්‍රභවය හා පරිණාමය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රය ඉදිරිපත් කරන කරුණු අතුරින් හතරක් ගෙනහැර දක්වන්න. *(ලකුණු 04 යි)*

   (ii) අග්ගඤ්ඤ සූත්‍රයෙහි ලෝක විභාගයට අදාළ ඉගැන්වීමෙහි සංවට්ටමාන හා විවට්ටමාන කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

   (iii) "නූතන සමාජය තුළ ගැටුම් හා විෂමතා පැනනැගීමට ප්‍රධාන සාධකය වී ඇත්තේ ආර්ථිකයයි." සමතුලිත සාධාරණ සමාජයක් උදෙසා ආර්ථිකය විෂයෙහි දේපළ අයිතිය, බදු ක්‍රමය, රාජ්‍ය පාලනය හා අධිකරණය යන සංස්ථාවල කාර්යභාරය කවරේ දැයි අග්ගඤ්ඤ සූත්‍ර විවරණය ඇසුරින් සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

5. (i) මිනිසා හා බැඳී පවත්නා, විශ්ව සාධාරණ ලෙස බලපාන නියාම ධර්ම අතුරින් හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

   (ii) බුදුසමයෙහි ඉගැන්වෙන සංසාර සංකල්පය ජීව-අජීව පරිසරය කෙරෙහි බලපාන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

   (iii) නූතනයෙහි ඒකාංශිකව අවධානය යොමු කොට ඇති මානව හිතවාදයකට හෝ සත්ත්ව හිතවාදයකට හෝ වඩා බුදුසමය පරිසරය කෙරෙහි ජීව හිතවාදී ආකල්පයක් දක්වන්නේ දැයි බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

6. (i) බුද්ධකාලීන භාරතීය සංකීර්ණ ආගමික පරිසරය නියෝජනය කළ ශ්‍රමණ කණ්ඩායම් හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

   (ii) එම ශ්‍රමණ කණ්ඩායම් අතර එකිනෙකා නුරුස්සමින්, විවිත්‍ර දෘෂ්ටිවාද මතුකරමින් ඉදිරිපත් කළ ආගමික ඉගැන්වීම් හතරක් කෙටියෙන් දක්වන්න. *(ලකුණු 07 යි)*

   (iii) වර්තමාන ශ්‍රී ලාංකික සමාජයේ විවිධ ආගමික පිරිස් අතර දෘෂ්ටිවාද හා විවිධ ක්‍රියාකාරකම් නිසා වරින්වර පැනනගින නොසන්සුන්තා සමනයට බුදුරදුන්ගේ ආගමික සහනශීලී ප්‍රතිපත්තිය උපයෝගී කරගත හැකි ආකාරය ඉදිරිපත් කරන්න. *(ලකුණු 07 යි)*

[4 වැනි පිටුව බලන්න.

**7.** (i) ජනගහන වර්ධනය නිසා රටක සංවර්ධනයට සෘජුව බලපෑම් ඇති කළ හැකි ගැටලු හතරක් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ජනගහන පාලනයෙහිලා අනුගමනය කෙරෙන ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 07 යි)*

(iii) ජනගහන පාලනයෙහිලා නූතනයෙහි යම් ප්‍රවණතාවක් වී ඇති ගර්භනාසය හෙවත් ගබ්සාව විෂයයෙහි බුදුසමයේ ආකල්පය දක්වා, එහි ලා ඉදිරිපත් කළ හැකි නිර්දේශ සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

**8.** (i) ගෘහස්ථයා ආර්ථික සත්ත්වයකු වශයෙන් හැඳින ගන්නා, බුදුසමය නිර්දේශ කරන, ආර්ථිකය සමග බැඳුණු චතුර්විධ සුඛ ලියා දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) "මිනිසා ධනය රැස්කළ යුත්තේ තමා පමණක් සැපවත් වීම (ස්වාර්ථය)ට පමණක් නොව පරාර්ථය පිණිස ද යෙදවීමට ය." බුදුසමයේ ධනය පිළිබඳ ආයතන පරිභෝජන සංකල්පය ඇසුරින් ඉහත ප්‍රකාශය තහවුරු කරන්න. *(ලකුණු 07 යි)*

(iii) කෙසේ හෝ ධනය උපයා ගැනීමෙන් ආර්ථික සමෘද්ධිය සලසා ගැනීමේ නූතන සමාජ ප්‍රවණතාව, බුදුසමයේ ආර්ථික දර්ශනයට එකඟ වන්නේ දැයි එහි සදාචාර නිර්ණායක ඇසුරින් විමසන්න. *(ලකුණු 07 යි)*

* * *